# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, සුහුරුපාය

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 851 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 20/05/2024<br>පැය 1710 |

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ වැඩබලන අධ්‍යක්ෂ ධූරයෙහි වැඩ භාර ගැනීම.**

ශ්‍රී ලංකා පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ නව වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් සහකාර පොලිස් අධිකාරී ඩබ්.එම්. මිනුර සෙනරත් මහතා 2024.05.17 වන දින සිට පත්කර ඇත.

2019.10.01 වන දින ආධුනික සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස ශ්‍රී ලංකා පොලිස් සේවයට එක්වන ඒ මහතා 2021 ජනවාරි මස සිට කොළඹ මධ්‍යම කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස රාජකාරී ඉටු කිරීමෙන් පසු 2024.05.20 වන අද දින සිට බත්තරමුල්ල සුහුරුපාය 14 වන මහල පිහිටි මාධ්‍ය කොට්ඨාසයේ වැඩ බලන අධ්‍යක්ෂ ධූරයේ රාජකාරී සුභ මොහොතින් ආරම්භ කරන ලදී.

සහකාර පොලිස් අධිකාරී ඩබ්.එම්. මිනුර සෙනරත් මහතා මතුගම ශාන්ත මේරි විද්‍යාලයේ ආදී ශිෂ්‍යයකු වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අපරාධ විද්‍යා ප්‍රථම පන්තියේ උපාධිය, නීතිවේදී උපාධිය, ජාත්‍යන්තර සබඳතා පිළිබඳව උසස් ඩිප්ලෝමා පාඨමාලාව සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ලේඛකත්වය හා ජන සන්නිවේදනය පිළිබඳ පාඨමාලාවද හදාරා ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**